කීප්-එ-සයිඩ් කුකිං ක්‍රමය

අපේ වැඩිහිටි පරම්පරාවල පිරිමින් ළමා කාලයේ දී හැදී ඇත්තේ ඔවුන් ගේ අම්මලා නිවසේ දී උයා දුන් රසමසවුල් රිසි සේ වළඳමිනි. නමුත්, ඒ කෑම වර්ග සාදන ආකාරය ගැන ඔව්හු කිසිදු අත් හුරුවක් හෝ උගැන්මක් හෝ නොලද්දහ.

එයට ම සරිලන ලෙස අපේ වැඩිහිටි පරම්පරාවල ගැහැණුන් ළමා කාලයේ සිට ම, බත් හැලියට නිවැරදි ප්‍රමාණයට වතුර එකතු කර රොස් නොවී, බෙර නොවී, උයාගන්නා ආකාරයේ සිට හොද්දට ගුණු ඇඹුල් දමන විදිය දක්වා ද, කිරි ටොෆි හැදීමේ සිට පැණි කැවුමේ කොණ්ඩය බැඳීම දක්වා ද තම අම්මලාගෙන් උගත්හ.

අපේ කාලය වන විටද, මගේ අත්දැකීම අනුව පවසතොත්, පිරිමි ළමෝ අම්මලාට පොල් බෑයක් ගා දීම හෝ බෝන්වි ටිකක් සුද්දකර දීම හැරුණු විට වෙනත් කුස්සියේ වැඩකට සම්මාදම් නොවූහ. ඒ සමගම, ශිෂ්‍යත්වේ, සාපේ, ඌපේ යනාදී විභාගවල තරගකාරිත්වය කෙමෙන් වැඩිවීමත්, පාසලෙන් පසු ඉතිරිවන කාලය ටියුෂන් ව්‍යාපාරයේ ග්‍රහණයට අසුවීම නිසා නැති නාස්ති වීමත් සමගම ගැහැණු ළමෝ ද කුස්සියෙන් ක්‍රමක්‍රමයෙන් ඈත් වන්නට වූහ.

මේ ගැහැණු ළමයින්ගෙන් අති බහුතරය, විභාග අභාගවලින් පසුව, කෙදිනක හෝ විවාහ සංස්ථාවේ රැකියාව පටන් ගන්නට පෙර, තමන් ගේ අම්මාලාගෙන් ද, නගරයේ කුකරි පන්තිවලින් ද, ඉවුම් පිහුම් පිළිබඳ කඩිනම් පාඨමාලා හදරන්නට අනිවාර්යෙන් ම පෙළඹුනහ. එහෙත්, පිරිමින් ගැන කියනවා නම්, කලාතුරකින් දුර පලාතකට රැකියාවකට ගොස් තව්ට තනියම ජීවත් වෙන්නට ලැබුණු අයෙක් හැර, කව්ට සම්බෝලයක්වත් හදා ගන්නට ඉගෙන ගත්තේ එහෙමත් එකෙක් පමණි.

සරල ඉවුම් පිහුම් ශ්‍රිතයකට අනුව පිරිමින් වර්ගීකරණය කළහොත් අපට සුවිශේෂී කොටස් හතරක් හඳුණා ගත හැකිය.

මුලින්ම ඉන්නේ ඉවුම් පිහුම්වලට හැකියාවකුත් උනන්දුවකුත් ඇති මා වැන්නෝ ය. සිය බිරින්දෑවරුන් ගේ ඉමහත් ප්‍රසාදයට සහ හාදු වර්ෂාවලට නිරතුරු බඳුන්වන මේ පිරිස, සමස්ත පිරිමි ගහණයෙන් ඉතා සුළුතරයක් වේ.

රමණී නෝනා සමග විවාහ වී, ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කර "අපි දෙන්නයි, දරු දෙන්නයි" මොඩලයේ කුඩා පවුලක් බවට පත් වූ මා මිත්‍ර

අපේ කාලේ කතන්දර

රසික සූරියආරච්චි

රත්නායක මහත්තයා අයත්වන්නේ ඉවුම් පිහුම් වැඩවලට හැකියාවක් නැතත් උනන්දුවක් නම් ඇති පිරිසටයි.

හැකියාව ඇතත්, උනන්දුවක් නොමැති පිරිසක් ද වෙති. ඔවුන් ගේ ඒ උනන්දුව නැතිකම ඇත්තක් ද නැතිනම් ආත්මාර්තකාමී රඟපෑමක් ද යන්න දන්නේ ඔවුන් ම පමණකි.

ඉවීමට හැකියාවක් නැති, එසේම කිසිදු උනන්වක් ද නැති පිරිස බොහෝ ය. ඔවුන් ගැන ලිවීමට වචන නාස්ති කිරීම ද මහා පාපයක් බව, මේ ලිපිය කියවන එවැන්නන් ගේ බිරින්දෑවරු එක හඬින් පවසනු නො අනුමානය.

ඉවුම් පිහුම්වලට තමන් ගේ ඇති උනන්දුවෙන් ප්‍රයෝජනයක් ගන්නට රත්නායක මහත්තයාට ඉඩ ප්‍රස්ථාවක් ලැබුණේ, තම දෙවෙනි දරුවා තරමක ලොකු මහත් වී රමණී නෝනා සති අන්තවල රැකියාවක් කරන්නට පටන් ගත් පසුය.

මුලදී මුලදී රමණී නෝනා ම, සෙනසුරාදා සහ ඉරිදා ආහාරය සඳහා ඇති තරම් මාළු පිණි වර්ග කලින් සාදා ශීතකරණයේ ගබඩා කළ ද, පසුව ඇයට ඇතිවූ කාර්ය බහුලත්වය නිසාත්, තමා ගේ ඉවුම් පිහුම් කටයුතුවලට තිබුණු සැබෑ උනන්දුව නිසාත් රත්නායක මහතා ද, බිරිඳ සති අන්තයේ දිනවල වැඩට ගිය පසු දිවා කාලයේ දී, හොද්දක් දෙකක් උයන්නට පටන් ගත්තේ ය.

මුලදී, මුලදී රත්නායක මහත්තයා ඉව්වේ පරිප්පු ය. රමණී නෝනා තම සැමියා විසින් උයන ලද ඒ පරිප්පු කෑමට අප්‍රිය බවක් නොදැක්වූයෙන්, රත්නායක මහත්තයා ගේ උනන්දුව පරිප්පුවෙන්, බෝංචිවලට වැඩි දියුණු විය. ඔහු ගේ ඊලඟ අභිප්‍රාය වූයේ, රෙසටෝරන්ට් කොලිටියේ කෑමක් ඉවීමයි.

මෙහිදී රත්නායක මහත්තයා ගේ සිත ඇදී ගියේ වරක් දෙවරක් නිවස අසල ටවුමේ ඉන්දියානු ආපන ශාලාවෙන් මිළට ගෙන රස විඳි ඉන්දියානු ආරේ චිකන් කරි වර්ගය පිසීමටයි.

අන්තර්ජාලය පිරික්සා බැලූ රත්නායක මහත්තයාට කවුදෝ ඉන්දියන් ජාතික කාන්තාවක් විසින් සකසන ලද ඒ

39 වන පිටට

ADVICE ON LEGAL MATTERS

GATEWAY LAWYERS

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises
Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor.....etc

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia
Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au